## කොන්ඩම් පළඳින නියම ආකාරය

- එක් අවස්ථාවකදී එක් කොන්ඩමයක් පළඳින්න
- කොන්ඩම් දෙකක් පැළඳීමෙන් කොන්ඩමයට හානි සිදුවිය හැක
- ගුද ලිංගික සංසර්ගය සඳහා සැමවිටම ස්නේහක භාවිතා කරන්න
- එක් එක් ලිංගික ක්‍රියාකාරකම් සඳහා විවිධ වර්ගයේ කොන්ඩම භාවිතා කළයුතු වේ (යෝනි, මුඛ, ගුද)
- ඔබට රබර් සහිත කොන්ඩම් භාවිතා කිරීමේදී අසාත්මිකතා ඇතිවේ නම් පොලියුරතින් නැමති ද්‍රව්‍යයෙන් සාදන ලද කොන්ඩම් භාවිතා කරන්න

## මම දැනටමත් HIV ආසාදිතයෙකු නම් කොන්ඩමයක් පැළඳිය යුතු වන්නේ ඇයි?

- ලිංගාශ්‍රිත රෝග වලින් ආරක්ෂා වීමට
- HIV ආසාදනය සඳහා දෙනු ලබන ප්‍රති වෛරස් ඖෂධ වලට ප්‍රතිරෝධකයින් සැදීම වැළැක් වීමට
- ඔබගේ HIV නොවැළඳුනු සහකාරිය/සහකරු ආරක්ෂා කිරීමට උදව් වීමට

CONDOMIZE

## සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරන්න, ආරක්ෂිත කොන්ඩම් නිවැරදිව සහ හැමවිටම භාවිතා කරන්න

- ඕනෑම ෆාමසි හෝ වෙළෙඳසැල් හරහා කොන්ඩම් මිලදී ගත හැක
- ලිංගාශ්‍රිත රෝග සායන මගින් රෝග පරීක්ෂා කිරීම, උපදේශනය, වෛද්‍ය ප්‍රතිකාර සහ කොන්ඩම් බෙදාහැරීම සිදුකරේ
- රෝගීන්ගේ තොරතුරු වල රහසිගත භාවය ආරක්ෂා කිරීමට කාර්ය මණ්ඩලය විශේෂ පුහුණුවක් ලැබ තිබේ



ඔබට ලිංගික සම්ප්‍රේෂිත රෝග සම්බන්ධව යම්කිසි ගැටළුවක් ඇත්නම් කරුණාකර ළඟම ඇති ලිංගාශ්‍රිත රෝග සායනය වෙත පැමිණෙන්න

**ලිංගාශ්‍රිත රෝග සායන පවත්වන රජයේ රෝහල් හා ඒවායේ දුරකථන අංක**

**මධ්‍යම සායනය කොළඹ - 011 2667163, 011 2696433**

| | | | | | |
|---|---|---|---|---|---|
| අම්පාර | - | 063-2224239 | කිලිනොච්චි | - | 021-2285327 |
| අනුරාධපුරය | - | 025-2236461 | කුරුණෑගල | - | 037-2224339 |
| බදුල්ල | - | 055-2222578 | මන්නාරම | - | 023-2250573 |
| බලපිටිය | - | 091-2256822 | මාතලේ | - | 066-2222261 |
| මඩකලපුව | - | 065-2222261 | මාතර | - | 041-2232302 |
| හලාවත | - | 032-2220750 | මොණරාගල | - | 055-2276826 |
| ඇඹිලිපිටිය | - | 047-2230261 | මහමෝදර | - | 091-2245998 |
| ගාල්ල | - | 091-2245998 | මහියන්ගනය | - | 055-2257261 |
| ගම්පහ | - | 033-2234383 | මීගමුව | - | 031-2222261 |
| හම්බන්තොට | - | 047-2222247 | නුවරඑළිය | - | 052-2222261 |
| යාපනය | - | 021-2217756 | පොළොන්නරුව | - | 027-2225787 |
| කලුබෝවිල | - | 011-4891055 | රාගම | - | 011-2960224 |
| කල්මුණේ | - | 067-2223660 | රත්නපුර | - | 045-2226561 |
| කළුතර | - | 034-2236937 | ත්‍රිකුණාමලය | - | 026-2222563 |
| මහනුවර | - | 081-2203622 | වවුනියාව | - | 024-2224575 |
| කෑගල්ල | - | 035-2231222 | වතුපිටිවල | - | 033-2280261 |


**විමසීම්:**

ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

නො. 29, ද සේරම් පෙදෙස, කොළඹ 10.

දුරකථන: 011 2667163

ෆැක්ස්: 011 5336873, 2682859

ඊමේල්: info@aidscontrol.gov.lk

වෙබ්අඩවිය: www.aidscontrol.gov.lk

**සම්බන්ධීකරණය:**

බහුආංශික අංශය

ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

දුරකථන: 011 2687625

ඊමේල්: multiunitnsacp@yahoo.com


# ආදරය සහ සතුට

ONE AT A TIME



## ආරක්ෂාව, පරිස්සම ආදරය සහ සතුට

## කොන්ඩම් මගින් ද්විත්ව ආරක්ෂාවක්

NATIONAL STD/AIDS CONTROL PROGRAMME

## ඔබට කොන්ඩම් මගින් සතුට සහ සැබෑ ආදරයට ළඟාවිය හැක්කේ කෙසේද?

- අනවශ්‍ය ගැබ් ගැනීම් වලින් ආරක්ෂා වීම
- ලිංගාශ්‍රිත රෝග වලින් සහ **HIV** වලින් ආරක්ෂා වීම



## කිසිම ගැටළුවකින් තොරව මට කොන්ඩම් ළඟ තබා ගත හැකිද?

**ඔව්**

එය අත්‍යාවශ්‍ය ඖෂධ ලේඛණයේ තිබෙන වෛද්‍ය උපාංගයකි.

## මට විවිධ වර්ගයේ කොන්ඩම් තෝරා ගත හැකිද?

**ඔව්**

- ඒවා
  විවිධ වර්ණ
  විවිධ රස
  විවිධ ස්වභාවයන්ගෙන්
  වෙළෙඳපලේ ඇත



## එය මගේ ලිංගික තෘප්තිය අවම කරනවාද?

**කොහෙත්ම නැත**

ලිංගික ක්‍රියාවලිය දිගු කිරීමට උදව් වන බැවින් ලිංගික තෘප්තිය වැඩි කරයි

## මට කොන්ඩම් තබා ගත හැක්කේ කෙසේද?

- සිසිල් වියළි ස්ථානයක තබන්න
- හිරු එළියට නිරාවරණය නොකරන්න



## මම නිවැරදිව කොන්ඩමය පළඳින්නේ කෙසේද?

- කල් ඉකුත් වීමේ දිනය පරීක්ෂා කරන්න
- කොන්ඩමය හොඳ තත්වයේ පවතී දැයි පරීක්ෂා කරන්න

### පියවර 1

- ඇඟිලි තුඩුවලින් පැකැට්ටුවේ දැති සහිත දාරයෙන් ඉරා පැකට්ටුව විවෘත කරන්න (කතුරු, දත් හෝ වෙනත් තියුණු උපකරණ භාවිතා නොකරන්න)
- කොන්ඩමය දිග හැරෙන පැත්ත තෝරා ගන්න

### පියවර 2

- කොන්ඩමයේ පුඩුව පිටතට යොමු වී තිබිය යුතුය
- ලිංගික ස්පර්ශ වීමකට ප්‍රථම ඍජු වූ ශිෂ්ණයට කොන්ඩමය පළඳින්න




- වාතය නොරැඳෙන පරිදි කොන්ඩමයේ පුඩුව අල්ලා ගන්න. එමගින් ශුක්‍රාණු රැඳීමට ඉඩ සැලසෙන අතර කොන්ඩමය පැලීම වළක්වාලයි

### පියවර 3

- ශිෂ්ණය සම්පූර්ණයෙන් වැසෙන සේ කොන්ඩමය පළඳින්න
- ස්නේහක (lubricants) නොමැති කොන්ඩමයක් නම් කොන්ඩමයේ පිටත ස්නේහක ආලේප කරන්න

### පියවර 4

- සංසර්ගයෙන් පසු ශිෂ්ණය අඩපණ වීමට පෙර කොන්ඩමය ඉවත් කරන්න
- ලිංගික ස්‍රාව සමඟ නොගෑවන සේ ශුක්‍රාණු ඉහිරීමට නොදී කොන්ඩමය ඉවත් කර ගැනීමට ටිෂූ කැබැල්ලක් භාවිතා කරන්න
- කොන්ඩමයේ විවෘත කෙළවර අගින් ගැට ගසා ටිෂූ කැබැල්ලෙහි ඔතා කුණු කූඩයට දමන්න වැසිකිළි වල තුලට නොදමන්න



## කොන්ඩම් ලබා ගත හැක්කේ කුමන ස්ථානවලදීද?

නොමිලේ කොන්ඩම් ගත හැකි ස්ථාන

1. ලිංගාශ්‍රිත රෝග සායන/පවුල් සංවිධාන සායන
2. ප්‍රජා සෞඛ්‍ය අංශ - පවුල් සෞඛ්‍ය නිළධාරිණියන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්

මිලදී ගත හැකි ස්ථාන

සුපිරිවෙළඳ සැල්, ඔසුසැල් සහ වෙළඳ සැල්